## භෞතික භූගෝල විද්‍යාව

නිපුණතාව 12 - ස්වාභාවික උපද්‍රව භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පරීක්ෂා කරයි.

නිපුණතා මට්ටම 12.1 – ස්වාභාවික උපද්‍රවවල හා ආපදාවල වෙනස පැහැදිලි කරයි.

12.2 - ලෝකයේ ස්වාභාවික උපද්‍රව පැහැදිලි කරයි.

**ස්වාභාවික උපද්‍රව හා ආපදා -**

- උපද්‍රවය - ස්වාභාවික ක්‍රියාවලි හේතුවෙන් ප්‍රජාවට හෝ දේපළවලට හා පරිසරයට හානියක් සිදු විය හැකි සංසිද්ධියක් උපද්‍රවයක් ලෙස හඳුන්වයි.
- ආපදාව - උපද්‍රවයක් මිනිස් ජීවිතයට,දේපළවලට හා පරිසරයට හානි සිදු වන අයුරින් සක්‍රීය වීම ආපදාවක් වශයෙන් හැඳින්වේ.

ඇතැම් විට මානව ක්‍රියාකාරකමක් හේතුවෙන් ද උපද්‍රවයක් හෝ ආපදාවක් ඇති විය හැකිය.

**අභ්‍යාස**

1.නියඟ ප්‍රධාන වර්ග තුන නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

2.නියඟ උපද්‍රවයක් ආපදාවක් වීමට තුඩු දෙන හේතු මොනවාද?

3.අකුණු ඇති විය හැකි ක්‍රම මොනවාද?

4.සුනාමි ඇතිවීම සඳහා බලපාන හේතු මොනවාද?

5.ලැව්ගිනි ආපදා තීව්‍ර කිරීමට බලපාන හේතු දක්වන්න.

6.ලෝකයේ ප්‍රධාන යමහල් කලාප 4 නම් කරන්න.

7.ක්‍රියාකාරීත්වය අනුව යමහල් වර්ග 3 දක්වන්න.

8.නායයෑම් සඳහා බලපාන භෞතික හේතු හා මානුෂ ක්‍රියාකාරකම් 5 බැගින් දක්වන්න.